අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ - 06/2022

මගේ අංකය : MOJ/E9/ඩි.පි.නි.කි./2022
අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
කොළඹ 10.
2022.08. [illegible]

සියලුම මහාධිකරණ විනිසුරුවරුන්,
සියලුම දිසා විනිසුරුවරුන්,
සියලුම මහේස්ත්‍රාත්වරුන්,
සියලුම කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන්,
රෙජිස්ට්‍රාර් ශ්‍රේෂ්ඨාධිකරණය,
රෙජිස්ට්‍රාර් අභියාචනාධිකරණය,

## නඩු විභාගවල නඩු වාර්තා සහ ශ්‍රව්‍ය/දෘශ්‍ය පටිගතකිරීම්වල ඩිජිටල් පිටපත් නිකුත් කිරීම

නව තාක්ෂණය අධිකරණ ක්ෂේත්‍රයට හඳුන්වා දීම මගින් නීති කාර්යයන් සඳහා යන වියදම හා කාලය අවම කිරීම හා ක්‍රියාවලිය සරල කිරීම තුළින් මහජනතාවට කාර්යක්ෂම හා කඩිනම් සේවාවක් සැපයීම අරමුණු කර ගනිමින් නඩු වාර්තාවල ඩිජිටල් පිටපත් හා නඩු විභාගවල ශ්‍රව්‍ය / වීඩියෝ පටිගත කිරීම්වල පිටපත් නිකුත් කිරීම සඳහා පහත සඳහන් පරිදි ගාස්තු අය කිරීම සඳහා අංක අමප/22/0338/330/019 හා 2022.03.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබී ඇත.

02. ඒ අනුව නඩු වාර්තාවල ඩිජිටල් පිටපත් හා නඩු විභාගවල ශ්‍රව්‍ය / වීඩියෝ පටිගත කිරීම්වල පිටපත් නිකුත් කිරීමේදී අයකරගත යුතු ගාස්තු පහත පරිදි වේ.

**2.1** නඩු වාර්තාවල ඩිජිටල් පිටපත් නිකුත් කිරීමේ ගාස්තු

I. සංයුක්ත තැටි (CD) 01 ක් සඳහා අය කිරීම — රු.100/-
II. පරිලෝකනය කිරීම සහ පිටපත් කිරීමට එක් පිටුවක් සඳහා අය කිරීම — රු. 3/-

**2.2** නඩු විභාගවල ශ්‍රව්‍ය පටිගතකිරීම් නිකුත් කිරීමේ ගාස්තු

I. USB Drive (16 GB) 01 ක් සඳහා අය කිරීම — රු.1500/-
II. ශ්‍රව්‍ය පටිගතකිරීම් සෑම මිනිත්තු 30 ක් සඳහා අය කිරීම — රු. 500/-

**2.3** නඩු විභාගවල වීඩියෝ පටිගතකිරීම් නිකුත් කිරීමේ ගාස්තු

I. USB Drive (16 GB) 01 ක් සඳහා අය කිරීම — රු.1500/-
II. වීඩියෝ පටිගතකිරීම් සෑම මිනිත්තු 30 ක් සඳහා අය කිරීම — රු. 750/-

03. ඩිජිටල් පිටපත් සහ ශ්‍රව්‍ය/වීඩියෝ පටිගත කිරීම් නිකුත් කිරීම වෙනුවෙන් අය කරනු ලබන ගාස්තුවෙන් (සංයුක්ත තැටි සහ USB Drive සඳහා අය කරනු ලබන ගාස්තු හැර) අදාළ නිලධාරීන්ට ගෙවිය යුතු ප්‍රතිශතයන් පහත පරිදි වේ.

**3.1** නඩු වාර්තාවල ඩිජිටල් පිටපත් නිකුත් කිරීමේ ගාස්තු

| | | |
|---|---|---|
| I. | පරිලෝකනය සහ පිටපත් කිරීම සිදු කරනු ලබන නිලධාරියාට | 20% |
| II. | අන්තර්ගතය පරීක්ෂා කොට සහතික කරනු ලබන නිලධාරියාට | 10% |

**3.2** නඩු විභාගවල ශ්‍රව්‍ය/වීඩියෝ පටිගතකිරීම් නිකුත් කිරීමේ ගාස්තු

| | | |
|---|---|---|
| I. | සංස්කරණය සහ පිටපත් කිරීම සිදු කරනු ලබන නිලධාරියා | 25% |
| II. | අන්තර්ගතය පරීක්ෂා කොට සහතික කරනු ලබන නිලධාරියා | 10% |

04. ඉහත පරිදි අයකරනු ලබන ගාස්තුවෙන් රජයට අයවිය යුතු ගාස්තුව රාජ්‍ය ආදායමක් වශයෙන් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු අතර අදාළ කාර්යයට සෘජුවම සම්බන්ධ වන නිලධාරීන්ට පමණක් ඉහත සඳහන් දීමනාව ගෙවීමට කටයුතු කළ යුතු අතර ඉහත කාර්යය සඳහා අවශ්‍ය සංයුක්ත තැටි(CD) හා USB Drive අදාළ අධිකරණ විසින් සැපයීමට කටයුතු කිරීම වඩාත් සුදුසු වනු ඇත.

05. මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2022.08.25 දින සිට ක්‍රියාත්මක වේ.

වසන්ත පෙරේරා
ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

පිටපත : 1. ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව
2. ප්‍රධාන මූල්‍ය නිලධාරී , අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය